**සභාපතිතුමාගේ පණිවුඩය**



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි 2018 වර්ෂයේ කාර්යසාධනය සංක්ෂිප්ත ලෙස දක්වමින් මෙම ආයතනයෙහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මම අතිශය සතුටට පත්වෙමි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ස්ථාපනය කිරීමෙන් වසර 15 කට අනතුරුව එහි කාර්යසාධනය සමාලෝචනය කිරීමේ දී තරඟකාරී ව්‍යාපාරික වටපිටාවක් තුළ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත අරමුණු යම් ප්‍රමාණයකට මුදුන්පත් කර ගැනීමට අධිකාරිය සමත්ව ඇති බව අනිවාර්යයෙන් ම දැක්විය යුතු කරුණකි.

තාක්ෂණික වශයෙන් දියුණු වත්මන් යුගයෙහි ඕනෑම උගත් පාරිභෝගිකයෙකුට විවෘත ආර්ථික ව්‍යාපාපාරික පරිසරය තුළ අසාධරණ වෙළඳ භාවිතයන්, කොන්දේසිගත ව්‍යාපාරික කටයුතු, වෙළදාම සීමා කිරීම්, සහ අසාධාරණ වෙළඳ කොන්දේසි ආදී අවිධිමත් වෙළඳ ප්‍රතිපත්ති වලට මුහුණදිය හැකිය. මෙබඳු අර්බුධකාරී පරිසරයක් තුළ පාරිභෝගික ජනතාව ආරක්ෂා කිරීම සඳහා නෛතික අනුමැතිය ප්‍රකාරව නව මෙන්ම විශේෂ විධාන නිකුත් කරමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඉමහත් පරිශ්‍රමයක් දරා තිබේ. එමෙන් ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා රේගුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ සහයෝගීත්වයෙන් පාරිභෝගිකයන් දැනුවත් කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගික හිතවාදී පියවර රැසක් ගෙන තිබේ. මීට අමතරව, ව්‍යාපාරික සහ පාරිභෝගික යන දෙපාර්ශවයම දැනුවත් කිරීමේ අරමුණින් අධිකාරිය වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වනු ලබන අතර එමඟින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය තුළ දැනුමෙන් පිරිපුන් පාරිභෝගික මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවක් බිහිවීම සහතික කෙරේ.

අධිකාරිය විසින් 2018 වර්ෂයේ දී මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 597 ක් සහ ව්‍යාපාරිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 608 ක් පවත්වා තිබේ. මීට අමතරව, පාරිභෝගික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ළමා පරපුර දැනුවත් කිරීම සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 247 ක් පවත්වා තිබේ. මේ අතරතුර, සාර්ථක වැටලීම් 23, 532 ක් සිදු කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස වංචාකාරී වෙළෙන්දන්ට එරෙහිව නඩු 22,571 ක් විභාග වෙමින් පවතියි. මෙම නඩු වලට අදාළව පනවන දඩ ප්‍රමාණය රුපියල් මිලියන 94 ට අධික වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරී ඇති බලතල මඟින් පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීමේ බලය අධිකාරිය වෙත පැවරී තිබේ. ඒ අනුව 2018 වර්ෂයේ දී පැමිණිලි 2092 ක් ලද අතර මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නියෝග නිකුත් කරන ලදී. මෙම නියෝගයන්ට අනුගත නොවූ පාර්ශවයන්ට විරුද්ධව නීතිමය පිවර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කරන ලදී.

ආයතනික සාර්ථකත්වය උදා කරගැනීම සඳහා දායකත්වය සැපයූ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට මාගේ කෘතඥතාවය පළකිරීම සඳහා මම මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ සහ ලේකම්තුමාගේ අගනා උපදෙස්, පෙළඹවීම සහ මඟපෙන්වීම සම්බන්ධයෙන් මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

අවසන් වශයෙන් අධිකාරිය මඟින් සිදු කරන ලද සේවය අගයමින් ප්‍රශංසාත්මක පණිවිඩ යොමු කරන ලද පාරිභෝගිකයන්/පැමිණිලිකරුවන් වෙත මාගේ ස්තූතිය පළ කිරීමට කැමැත්තෙමි.

මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික)
සභාපති

# <u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය</u>

**දැක්ම**

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම.

**මෙහෙවර**

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

**ආයතනික ඉලක්ක**

1) වෙළෙඳාම විධිමත් කිරීම තුළින් වඩාත් තෘප්තිමත් වූ පාරිභෝගිකයින් බිහි කිරීම.
2) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලදී පාරිභෝගිකයාට සහන සැලසීම.
3) අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් පාරිභෝගිකයින් සවිබල ගැන්වීම.
4) තරඟ විරෝධී චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් හා සාදන්නන් ආරක්ෂා කරමින් යහපත් තරඟකාරිත්ව ප්‍රවර්ධනය කිරීම.
5) අධිකාරියෙහි කටයුතු පුළුල් කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම.

**ආයතනික සාරධර්ම**

- විශ්වාසනීයත්වය
  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම.
- අවංකභාවය සහ ඍජුභාවය
  සියලුම කාර්යයන්හි දී අවංකවීම, සාධාරණ වීම සහ යුක්තිගරුකවීම.
- වගකීමට බැඳී සිටීම
  විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතුබව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම.
- කණ්ඩායම් හැඟීම
  අන්‍යොන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලීභාවය වර්ධනය කරමින් පොදු ඉලක්කයන් කරා ළඟාකරගැනීම උදෙසා සියලුම සේවකයින් එක්ව කටයුතු කිරීම.
- ප්‍රසාදය පළ කිරීම
  සේවකයින්ගේ විශිෂ්ට කාර්යඵල අගය කිරීම සහ ප්‍රශංසා කිරීම
- අරමුණු ළඟා කරගැනීම සඳහා කැපවීම
  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටුකිරීම
- විශ්වසනීය ප්‍රතිචාර දැක්වීම
  සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම
- නිර්මාණශීලිත්වය සහ නව ක්‍රමෝපායන් භාවිතයට ගැනීම
  සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නව අදහස් උත්පාදනය කිරීම

1 වන සහ 2 වන මහළ
සතොස මහලේකම් ගොඩනැඟිල්ල
අංක. 27, වොක්ෂෝල් වීදිය
කොළඹ 02
2020.12.15

ගරු රාජ්‍ය අමාත්‍ය සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2018 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් වාර්තාව සහ විගණකාධිපති වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

**සභාපති**

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
# වාර්ෂික වාර්තාව -2018


| | පටුන | පිටු අංකය |
|---|---|---|
| 1. | අප ගැන | |
| | 1.1 හැඳින්වීම - - - - - - - | 05 |
| | 1.2 අධිකාරිය පිහිටුවීම - - - - - - | 05 |
| | 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය - - - - - | 06 |
| | 1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - - - - | 06 |
| 2. | අධිකාරියේ අරමුණු - - - - - | 07 |
| 3. | අධිකාරියේ කාර්යභාරය - - - - - - | 07 |
| 4. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය / පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව -2018 | 08-24 |
| 5. | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - - - | 25-26 |
| 6. | 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය - | 27 |
| 7. | 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය - | 28-35 |
| 8. | 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව - | 36-44 |
| 9. | විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස් දැක්වීම - | 45-47 |

**1.1 හැඳින්වීම**

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත අවලංගු කරමින් සම්මත කරන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවා මිල ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වෙළඳ පිළිවෙත්වලට එරෙහිව වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමයි. තවද හැකි සෑම අවස්ථාවකදී ම තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් අතර යහපත් තරඟයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

**1.2 අධිකාරිය පිහිටුවීම**

පනතෙහි විධිවිධාන අනුව අධිකාරිය සභාපතිවරයෙකුගෙන් සහ පනතෙහි විශේෂයෙන් දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින් අතරින් අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන දහයකයට නොඅඩු සංඛ්‍යාවක් වන සාමාජිකයින්ගෙන් ද සමන්විත වේ.

**අධිකාරියේ සාමාජිකයින්**

2018 වර්ෂය අවසානය වන විට තනතුරු දරන ලද සාමාජිකයින් ගේ නම් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| 1. | හසිත තිලකරත්න මහතා | සභාපති - 2018.06.09 දින තනතුරෙන් ඉල්ලා අස්විය |
| 2. | ආචාර්ය එම්. එම්. හිල්මි | පූර්ණ කාලීන සාමාජික - 2018.06.26 දින තනතුරෙන් ඉල්ලා අස්විය 26.06.2018 |
| 3. | එම්.ඒ.අන්සිල් මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 4. | එම්.ඉසෙඩ් . රසීන් මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 5. | ඒ.ආර්.බී. නිහමත්දීන් මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 6. | ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මිය | භාණ්ඩාගාර නියෝජිත |
| 7. | එම්.ටී.ඒ. සෙයින් මහතා | සාමාජික - 2018.06.19 දින තනතුරෙන් ඉල්ලා අස්විය |
| 8. | රුබන් වික්‍රමාරච්චි මහතා | සාමාජික - 2018.06.22 දින තනතුරෙන් ඉල්ලා අස්විය |
| 9. | එච්.බී. දයාරත්න මහතා | සාමාජික - 2018.06.19 දින තනතුරෙන් ඉල්ලා අස්විය |
| 10. | වරුණ සුරේන් අලව්ව මහතා | සාමාජික |
| 11. | ආචාර්ය ඒ.එම්.එම්.රියාස් | සාමාජික - 2018.06.19 දින තනතුරෙන් ඉල්ලා අස්විය |
| 12. | සින්නතම්බි නගියා මහතා | සාමාජික -2018.06.19 දින තනතුරෙන් ඉල්ලා අස්විය |
| 13. | අබ්දුල්ලා නසීර් මහතා | සාමාජික |
| 14. | ඒ.ඒච්.ඒම්.යූ. අරුණ බණ්ඩාර මහතා නිරීක්ෂක | |
| 15. | ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ මහතා සභාපති | |
| 16. | වෛද්‍ය ඒ.එල් ෆරීඩ් මහතා | සාමාජික |
| 17. | එම්.එස්.එම්. අලියාර් මහතා | සාමාජික |
| 18. | ඩී.ඩබ්ලිව්. ජෝන්දාසන් මහතා | සාමාජික |
| 19. | එම්.ඩී.එම්. රිස්වි මහතා | සාමාජික |
| 20. | එම්.ජී.ඒ. මුහයිමින් මහතා | සාමාජික |
| 21. | ඩී.ජීවනාදන් මහතා | සාමාජික |
| 22. | චමින්ද රෝහණ ගමගේ මහතා | සාමාජික |

## 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය

රූමි මර්ෂූක් මහතා අඛණ්ඩව 2015 වර්ෂයේ සිට අධිකාරියෙහි සභාපති ධූරය දරන ලද අතර 2018.07.09 දින සිට ජනාධිපති නීතිඥ අනුර බී මැද්දෙගොඩ මහතා එම ධූරයට පත්ව නැවතත් රූමි මර්ෂූක් මහතා 2018.11.28 දින සභාපති ධූරයට පත්විය. 2017.01.01. දින ඩී.ජීවනාදන් මහතා (ශ්‍රී.ලං.ප.සේ.) අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් ධූරයට පත් වූ අතර 2018.09.14 සිට එම්.එස්.එම්. ෆවුසර් මහතා එම තනතුර දරනු ලබයි.

**අධිකාරියෙහි අංශ ප්‍රධානීන්**

| | |
|---|---|
| 1. දීප්ති තිසේරා මිය<br>M.PA [PIM-Sri J] – නීතිඥ<br>අධ්‍යක්ෂිකා - නීති හා බලගැන්වීම් | 2. චන්ද්‍රිකා තිලකරත්න මිය<br>B.Sc Agri (Sp) M.Sc (Mgmt)<br>අධ්‍යක්ෂිකා - පාරිභෝගික කටයුතු සහ තොරතුරු<br>2018.05.01 දින සේවයෙන් ඉල්ලා අස්විය. |
| 3. සමන්තා කරුණාරත්න මිය<br>B.A (Econ) Sp (Hons), M. A. (Economics)<br>අධ්‍යක්ෂිකා -තරඟකාරීත්ව ප්‍රවර්ධන (වැඩබැලීමේ පදනම මත) | 4. සම්පත් අඟුලුගහ මහතා<br>B. Com (Sp) Hons, MBA, MIM (SL),AIPM(SL), AUKAP, PG Dip in Pers & HRM, Dip in PM<br>අධ්‍යක්ෂ-මානව සම්පත් සහ පරිපාලන |
| 5. ඩබ්ලිව්.එම් . ප්‍රියන්ත මහතා<br>MPM, B.Com (Sp) Hons, AIPFM, DPFM අධ්‍යක්ෂ - මූල්‍ය | 6. නිරංජලා ජෙගනාතන් මිය<br>ACA, MBA (J'pura)<br>අධ්‍යක්ෂිකා - මිලකිරීම් හා කළමනාකරණ |
| 7. රසිකා සාවිත්‍රි විජේසේකර මිය<br>B.Sc Accounting (Sp) Hon USJ, CBA,MAAT<br>අභ්‍යන්තර විගණක | |

## 1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

මෙම සභාව පිහිටුවන ලද්දේ වාණිජ නීතිය, ව්‍යාපාරික ව්‍යවසාය කළමනාකරණය, වෙළඳ ප්‍රතිපත්ති සහ පාරිභෝගික කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහිත විශේෂඥවරුන් තිදෙනෙකුගෙන් සමන්විතවය. මෙම සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් යොමුකරනු ලබන සියලු ඉල්ලීම් කෙරෙහි යොමු වී තීරණ ගතයුතුය. තවද, පනතෙහි 38 වන වගන්තිය යටතේ තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධ පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සහ තීරණ ගැනීම, 19 වන වගන්තිය යටත් උපරිම සිල්ලර මිල නියම කිරීම, සහ 19 වන සහ 20 වන වගන්ති යටතේ අනිසි මිලගණන් සම්බන්ධයෙන් චෝදනා කිරීම කිරීම පිළිබඳ වගකීමට සභාව බැඳී සිටියි.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයින්</u>

| | | |
|---|---|---|
| එන්. එම්. ෂහීඩ් මහතා | - | සභාපති |
| ඩී.ඩබ්ලිව් ජොන්තසන් | - | සාමාජික |
| එම්.ඩී.එම්.රිස්වි මහතා | - | සාමාජික |
| ලේඛා ආර්යරත්න මෙය (නීතිඥ) | - | සභා ලේකම් |

## 2. අධිකාරියේ අරමුණු

අ. පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.

ආ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

ඇ. හැකි සෑමවිටම පාරිභෝගිකයින්ට තරඟකාරී මිලකට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම හා

ඈ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන ලබාදීම.

## 3. අධිකාරියේ කාර්යභාරය

1) අධිකාරිය විසින් පහත දෑ පාලනය කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනු ලැබේ –

   අ. ව්‍යවසාය අතර සීමාකාරී වෙළෙඳ ගිවිසුම්

   ආ. ව්‍යවසායකයන් අතර මිල පිළිබඳ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මකකිරීම

   ඇ. වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළඳපොළේ සැලකියයුතු කොටසක දේශීය වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදාගැනීම; හෝ

   ඈ. දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරීත්වය

2) තරඟ විරෝධී හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදාගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදුකිරීම.

3) භාණ්ඩ හෝ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීත්වය පවත්වාගෙන ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.

4) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගතහැකිවීම සහ ඒවායේ තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, මිලදීගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම

5) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

6) මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.

7) වෙළෙඳපොල තරඟකාරීත්වය අඩු ඵලදායීතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොළෙහි තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම

8) වෙළෙඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාලව අධ්‍යයන භාරගැනීම, වාර්තා පළකිරීම, සහ මහජනතාවට තොරතුරු සැපයීම.

9) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම.

10) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

11) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම.

12) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම

13) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම.

14) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය වියහැකි පරිදි කිසියම් ආකාරයක කම්ටුවක් හෝ කම්ටු පත්කිරීම; සහ

15) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු ඉටුකිරීම.

## 4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය

ආයතනික ව්‍යුහය අනුව අධිකාරිය අධ්‍යක්ෂවරුන් 6 දෙනෙක් යටතේ පාලනය වන අංශ 6 කින් සහ අභ්‍යන්තර විගණන අංශයෙන් සමන්විත වේ. එනම්;

1) පාරිභෝගික කටයුතු සහ තොරතුරු
2) අනුකූලතා සහ බලගැන්වීම්
3) මිලකිරීම් සහ කළමනාකරණය
4) තරඟකාරීත්ව ප්‍රවර්ධනය
5) මුදල්
6) මානව සම්පත් සහ පරිපාලන
7) අභ්‍යන්තර විගණන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2018 වර්ෂය සඳහා වන කාර්යසාධනය පහත දැක්වේ;

**1. හානිකර මෙන්ම ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම**

**අ. පනතෙහි වගන්ති 10 සහ 12 යටතේ නිකුත් කරන ලද විධාන**

**විධාන අංක 65–** ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර 743 මඟින් නිශ්චිත ISO/TR 17276 ප්‍රකාරව සමෙහි ආලේප කරනු ලබන ක්‍රීම් වර්ග හා දියර වර්ග පරීක්ෂා කරන අවස්ථාවේ දී අනුමත බැරලෝහ උපරිම සීමාවන්ට අනුකූල විය යුතුය.

**විධාන අංක 66 –** සෑම සමෙහි ආලේප කරන ක්‍රීම් හා දියර බෝතලයකම, අසුරුමකම, හෝ පැකට්ටුවකම අවශ්‍ය තොරතුරු හැඟැදිලි ලෙස නොමැකෙන අයුරින් සලකුණු කිරීම අනිවාර්ය වේ.

**විධාන අංක 67 –** කිසිදු වෙළෙන්දෙකු, ආහාර පාන සපයන්නෙකු, සැකසූ ආහාර සපයන්නෙකු, හා / හෝ ආහාර පාන සැපයීමේ ව්‍යාපාරයක හෝ ඒ හා සමාන හෝ ඒ හා සම්බන්ධ ක්‍රියාවක / ක්‍රියාවලියක නිරත වන තැනැත්තෙකු / තැනැත්තන්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ප්‍රකාශයට පත් කළ ශ්‍රී ලංකා ප්‍රමිති 956, එනම්, ආහාර සැපයුම් ආයතන සඳහා යහපත් සෞඛ්‍යාරක්ෂිත භාවිත සංග්‍රහය පිළිබඳ ප්‍රමිති පාදක කරගෙන නිකුත් කරන ලද යහපත් නිෂ්පාදන පිළිවෙත් සහභා වූ සහතිකයක් ලබා ඇත්නම් මිස එවන් ව්‍යාපාරයන්හි නියැලීම නොකළ යුතුය.

ආ. පනතෙහි 20(5) වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග

**නියෝග අංක 50 –** නියෝග අංක 39 හි සඳහන් සම්පූර්ණ යොදය සහිත කිරිපිටි (දේශීය හා ආනයනික) යන අයිතමය එම නියෝගයෙන් ඉවත් කිරීම.

**නියෝග අංක 51 -** කිසිම නිෂ්පාදකයෙකු, වෙළෙන්දෙකු හෝ බෙදාහරින්නෙකු විසින් දේශීයව බෝතල් කළ පානීය ජලය උපරිම සිල්ලර මිලට වැඩියෙන් වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

**නියෝග අංක 52 –** කිසිම වෙළෙන්දෙකු හෝ බෙදාහරින්නෙකු ඇතුළු සැපයුම්කරුවකු විසින් සුදු සීනි (පැකට් කළ සහ පැකට් නොකළ) එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ වෙළඳාම සඳහා සැපයීම නොකළ යුතුය.

**නියෝග අංක 53 –** කිසිදු ආනයනකරුවකු විසින් සුදු සීනි එහි සඳහන් කර ඇති උපරිම තොග මිලට වඩා වැඩියෙන් වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ වෙළඳාම සඳහා සැපයීම නොකළ යුතුය.

**ඇ. ගුණාත්මකභාවයෙන් අඩු ආනයනික භාණ්ඩ විමර්ශනය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණයෙන් ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ දිවයිනට ඇතුළුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ. එබඳු සිද්ධීන් 132 ක් විමර්ශනය කරන ලද අතර ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රති- අපනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශ කරන ලදී.

ඈ. **ජාතික කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති / නීති හඳුන්වාදීම**

ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සෞඛ්‍ය අමාත්‍යාංශය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය , පරිසර අමාත්‍යාංශය , බලශක්ති අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික කවුන්සිලය යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ නීති හඳුන්වා සහාය දක්වයි.

**2. වංචාකාරී කටයුතු සහ අසාධාරණ වෙළඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම**

**අ. ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ සිවිල් සමාජ සහභාගීත්ව වැඩසටහන් මඟින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂාකිරීම, සංවර්ධනය කිරීම සහ බලය ලබාදීම සිදු කරනු ලැබේ. ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සඳහා සැලසුම් කරන ලද හා සකස් කරන ලද වැඩසටහන් මඟින් මෙය ක්‍රියාත්මක වේ.

2018 වර්ෂයේදී අධිකාරිය විසින් ව්‍යාපාරික ප්‍රජාව සඳහා වැඩසටහන් 608 ක් ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක **1 - 2018** දී පවත්වන ලද ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්

| **පළාත** | දිස්ත්‍රික්කය | ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන් |
|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව |
| මධ්‍යම පළාත | මහනුවර | 14 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 08 |
| නැගෙනහිර පළාත | අම්පාර | 29 |
| | මඩකලපුව | - |
| | ත්‍රිකුණාමලය | 11 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 06 |
| | පොළොන්නරුව | 14 |
| උතුරු පළාත | යාපනය | 01 |
| | කිලිනොච්චි | 08 |
| | මන්නාරම | 55 |
| | මුලතිවු | 22 |
| | වව්නියාව | 39 |
| වයඹ පළාත | කුරුණෑගල | 117 |
| | පුත්තලම | 157 |
| සබරගමු පළාත | කෑගල්ල | 11 |
| | රත්නපුර | 12 |
| දකුණු පළාත | ගාල්ල | 15 |
| | හම්බන්තොට | 08 |
| | මාතර | 10 |
| ඌව පළාත | බදුල්ල | 08 |
| | මොණරාගල | 05 |
| බස්නාහිර පළාත | කොළඹ | 22 |
| | ගම්පහ | 07 |
| | කළුතර | 24 |
| **එකතුව** | | **608** |

ආ. වෙළෙඳපොළෙහි සිදුකරන ලද වැටලීම් සහ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතෙහි විධිවිධාන අනුව ලේබලයෙහි උපදෙස් ප්‍රදර්ශනය කිරීම උල්ලංඝණය කිරීම , භාණ්ඩයේ සඳහන් මිලට වඩා වැඩි මිලකට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම , භාණ්ඩ සන්තකයෙහි තබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබාගැනීම , අධිකාරියෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල ඉහළ දැමීම , මිල දර්ශන ප්‍රදර්ශනය නොකිරීම , මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම, නොමඟ යැවීම හෝ වංචාකාරී කටයුතු සිදුකිරීම හෝ නිෂ්පාදකයින් / වෙළෙඳුන් විසින් සිදුකරන ලද ව්‍යාජ නියෝජන වැටලීමට ලක් කිරීම සහ විමර්ශනය කිරීම. වංචාකාරී වෙළෙඳුන්ට අදාලව පනතෙහි 60 වන වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පැවරීම සහ දඩ මුදල් නියම කිරීම සිදු කරනු ලැබේ.

**වගු අංක -2 - වෙළඳපොල වැටලීම් සහ දඩ මුදල් නියම කිරීම්වල ප්‍රගතිය**

| සිදුකරන ලද ක්‍රියාකාරකම් (ඉලක්ක) | වැටලීම් සංඛ්‍යාව | සිදුවීම් සංඛ්‍යාව | නියම කරන ලද දඩ (රුපියල්) |
|---|---|---|---|
| - **10** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (**10** වන වගන්තියෙහි දක්වන ලද උපදෙස් උල්ලංඝනය කිරීම) | 10,172 | 9,281 | 41,542,300 |
| - **11** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩයේ සඳහන් මිලට වඩා ඉහළ මිලකට අලෙවි කිරීම) | 607 | 645 | 2,090,250 |
| - **12** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ප්‍රමිතීන්ට අනුකූල නොවීම) | 177 | 157 | 726,000 |
| - **15** වන වගන්තිය සම්බන්ධ වෙළෙඳපොළ විමර්ශන | 5 | 3 | 9,000 |
| - **16** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ඕනෑම භාණ්ඩයක් සන්තකයේ තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම) | 12 | 13 | 99,000 |
| - **17** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩ සඟවා තබාගැනීම) | - | - | - |
| - **18** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (උපරිම සිල්ලර මිල පවත්වාගෙන යාම උල්ලංඝනය කිරීම) | - | - | - |
| - **20** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන | 1,827 | 2,095 | 8,027,500 |
| - **26** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (මිල දර්ශනය ප්‍රදර්ශනය නොකිරීම) | 5,471 | 5,481 | 16,561,300 |
| - **28** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (වෙළෙන්දන් විසින් මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම.) | 10 | 14 | 99,500 |
| - **30** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟ යැවීම සහ වංචාකාරී කටයුතු) | 2,558 | 2,490 | 13,443,400 |
| - **30** සහ **31** වන වගන්ති යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟයැවීම සහ ව්‍යාජ නියෝජන) | 1,643 | 1,387 | 7,033,200 |
| - **31** වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ව්‍යාජ නියෝජන) | 1,050 | 1,005 | 5,140,500 |
| මුළු වැටලීම් සහ දඩ නියම කිරීම් | **23,532** | **22,571** | **94,771,950** |

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලද විශේෂ වැටලීම්</u>**




වංචනික ලෙස ලේබල් කරන ලද කල් ඉකුත් වූ ඔලිව් තෙල්
තොගයක් (රුපියල් ලක්ෂ 100 ක් වටිනා බෝතල් 8,800)




සත්ත්ව පරිභෝජනයට සුදුසු සහල් මනුෂ්‍ය පරිභෝජනයට විකිණීම





රුපියල් ලක්ෂ හයක් වටිනා කල් ඉකුත් වූ රට ඉඳි

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරන ලද වැටලීම්</u>**




**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පනවන ලද දඩ</u>**




3. **අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයින්ට සහන සැලසීම**

අ. පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

පාරිභෝගික අධිකාරි පනතෙහි 13 වන සහ 32 වන වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වේ. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇප සහතිකය සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල නොවන පරිදි භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශන කළහැකිය.

වගු අංක **3** සහ **4** මගින් පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී 2018 වර්ෂයේදී අත්කර ගන්නා ලද ප්‍රගතිය දැක්වේ.

| | එකතුව |
|---|---|
| ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | 2092 |
| (අ). තැපැලෙන් | 1714 |
| (ආ). දුරකථන ඇමතුම් මගින් | 378 |
| වැටලීම් ( ප්‍රධාන කාර්යාලය/දිස්ත්‍රික් කාර්යාල ) | 67 |
| වෙනත් ආයතන වෙත පවරන ලද | 323 |
| විමර්ශන සඳහා යොමු කරන ලද පැමිණිලි | 407 |
| පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා සහ විමර්ශන වලට පෙර පැවැත්වූ සාකච්ඡා | 1460 |
| අවසන් කරන ලද සාකච්ඡා (අදාළ ගොනු අවසන් කළ) | 482 |

(පූර්ව වර්ෂයේ පැමිණිලි ද ඇතුළත්ව )

වගු අංක **– 4** - පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන :

| **පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන** | |
|---|---|
| විමර්ශන සංඛ්‍යාව | 492 |
| පූර්ව මාසයේ / වර්ෂයේ සිට සිදු කෙරෙන විමර්ශන | 407 |
| නව විමර්ශන | 79 |
| විසඳුම් ලබා දෙන ලද විමර්ශන | 123 |

(පූර්ව වර්ෂයේ පැමිණිලිද ඇතුළත්ව )

<u>අධිකරණ නඩු</u>

| වර්ගය | **2018** |
|---|---|
| අනුකූලවීම් හා බලගැන්වීම් අංශය මගින් පනවන ලද නව නඩු | 77 |
| අධිකරණයෙහි පෙනී සිටීම | 438 |
| දඩ (අධිකරණ නඩු වලදී ලැබෙන) | රු.47,000/- |

**4. පාරිභෝගික අධ්‍යාපනය සහ බල ගැන්වීම**

අ. පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය , සම්මන්ත්‍රණ සහ වැඩමුළු , ප්‍රදර්ශන ආදිය මගින් පාරිභෝගික අයිතීන් සහ වගකීම් , වර්තමාන පාරිභෝගික නීතිය යහපත් පාරිභෝගික චර්යාවන්, සහ යහපත් ව්‍යාපාරික පිළිවෙත් ආදිය පිළිබඳව දැනුවත් කරනු ලැබේ. මීට අමතරව පාරිභෝගික අයිතිවාසිකම් දිනය පාරිභෝගික කණ්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ එක්ව සමරනු ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතෙහි නීති රීති සම්බන්ධයෙන් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක **–5 - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙහෙයවන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්**

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ව්‍යාපාරික දැනුවත්කිරීම්** | **සාමාන්‍ය ජනතාව දැනුවත්කිරීම්** | **පාසැල් ශිෂ්‍ය දැනුවත්කිරීම්** |
|---|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 14 | 42 | 03 |
| | මාතලේ | 05 | 09 | 02 |
| | නුවරඑළිය | 08 | 13 | 03 |
| නැගෙනහිර පළාත | අම්පාර | 29 | 56 | 38 |
| | මඩකලපුව | 00 | 27 | 08 |
| | ත්‍රිකුණාමලය | 11 | 53 | 11 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 06 | 11 | 00 |
| | පොළොන්නරුව | 14 | 18 | 05 |
| උතුරු පළාත | යාපනය | 01 | 53 | 02 |
| | කිලිනොච්චි | 08 | 12 | 03 |
| | මන්නාරම | 55 | 37 | 11 |
| | මුලතිව් | 22 | 17 | 10 |
| | වව්නියාව | 39 | 21 | 15 |
| වයඹ පළාත | කුරුණෑගල | 117 | 40 | 13 |
| | පුත්තලම | 157 | 26 | 22 |
| සබරගමු පළාත | කෑගල්ල | 11 | 15 | 08 |
| | රත්නපුර | 12 | 23 | 09 |
| දකුණු පළාත | ගාල්ල | 15 | 16 | 03 |
| | හම්බන්තොට | 08 | 17 | 04 |
| | මාතර | 10 | 13 | 14 |
| ඌව පළාත | බදුල්ල | 08 | 10 | 15 |
| | මොණරාගල | 05 | 15 | 09 |
| බස්නාහිර පළාත | කොළඹ | 22 | 22 | 25 |
| | ගම්පහ | 07 | 15 | 05 |
| | කළුතර | 24 | 16 | 09 |
| **මුළු සංඛ්‍යාව** | | **608** | **597** | **247** |

වගු අංක – **6** - පාරිභෝගික සංවිධාන ස්ථාපනය කිරීම

| පළාත | දිස්ත්‍රික්කය | ස්ථාපනය කරන ලද පාසල් පාරිභෝගික සංවිධාන සංඛ්‍යාව | ස්ථාපනය කරන ලද පාරිභෝගික සංවිධාන සංඛ්‍යාව |
|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | - | - |
| | මාතලේ | - | - |
| | නුවරඑළිය | - | - |
| නැගෙනහිර පළාත | අම්පාර | - | - |
| | මඩකලපුව | 05 | - |
| | ත්‍රිකුණාමලය | 04 | 02 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | - | |
| | පොළොන්නරුව | - | |
| උතුරු පළාත | යාපනය | - | 01 |
| | කිලිනොච්චි | 02 | - |
| | මන්නාරම | 06 | - |
| | මුලතිව් | 08 | - |
| | වව්නියාව | 06 | 01 |
| වයඹ පළාත | කුරුණෑගල | - | - |
| | පුත්තලම | - | - |
| සබරගමු පළාත | කෑගල්ල | - | - |
| | රත්නපුර | 03 | - |
| දකුණු පළාත | ගාල්ල | - | - |
| | හම්බන්තොට | - | - |
| | මාතර | - | - |
| ඌව පළාත | බදුල්ල | - | - |
| | මොණරාගල | - | - |
| බස්නාහිර පළාත | කොළඹ | 03 | - |
| | ගම්පහ | - | - |
| | කළුතර | - | - |
| මුළු සංඛ්‍යාව | | **33** | **04** |

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්</u>**




කොළඹ මහජන පුස්තකාලයේ පවත්වන ලද ප්‍රදර්ශනයක්



පාසැල් සිසුන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහනක්



වෙළෙන්දන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම



පාරිභෝගිකයන් සඳහා ප්‍රදර්ශන පැවැත්වීම.

**5.** වෙළෙන්දන් සහ නිෂ්පාදකයින් ප්‍රති තරඟකාරී කටයුතු වලින් ආරක්ෂා කිරීම සහ යහපත් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | මුළු සංඛ්‍යාව |
|---|---|
| <u>වෙළඳ පැමිණිලි පිළිබඳ විමර්ශන</u><br><u>ප්‍රති තරඟකාරී මෙන්ම අසාධාරණ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත යොමු කළ පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වීම</u><br>• පෙර යොමුකරන ලද පැමිණිලි<br>• අදාළ කාලය තුළදී ලද පැමිණිලි<br>• සභාව වෙත යොමු කරන ලද පැමිණිලි<br>• වර්ෂය තුළ ඉවත් කරන ලද පැමිණිලි<br>• දැනට කටයුතු කරනු ලබන පැමිණිලි | <br><br><br><br>09<br>25<br>03<br>21<br>09 |
| <u>සැමදෙනාටම සාර්ථක වීම සඳහා අවස්ථා උදාකරමින් තරඟකාරීත්වය වැඩි කිරීම</u><br>2007/07/11 දින නිකුත් කළ අංක 1505/15 දරන ගැසට් නිවේදනය මඟින් හඳුනා ගන්නා ලද නිෂ්පාදන පහක් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම<br>• ලැබූ අයදුම්පත් සංඛ්‍යාව<br>• අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම | <br><br><br>273<br>273 |
| <u>අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පරීක්ෂාකිරීම</u><br>• කොළඹ සහ තදාසන්න ප්‍රදේශ පදනම් කරගත් 18/20 වගන්තියේ වාර්තාව<br>• දිස්ත්‍රික් මට්ටමෙන් විශ්ලේෂණය සහ වාර්තාකිරීම | <br>11<br>12 |
| <u>ආහාර ද්‍රව්‍යවල මිල පරීක්ෂාකිරීම</u><br>එළවළුවල දෛනික සිල්ලර මිල දැක්වෙන වාර්තා<br>අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිල දැක්වෙන වාර්තා<br>විශේෂ මිල වාර්තා | <br>160<br>160<br>200 |

| | |
|---|---|
| විශේෂ අධ්‍යයන | 03 |
| වෙළඳපොළ ව්‍යුහය හඳුනාගැනීම. | නිෂ්පාදන 39 ක් සම්බන්ධයෙන් 2017 වර්ෂයේ දී නිකුත් කරන ලද වාර්ෂික වාර්තා |
| වෙළෙන්දන් දැනුවත් කිරීම | 10 |
| 1977 අන්තර්ක්‍රියාකාරීත්ව ජංගම සේවය | පළමු සිව් මස තුළදී සතියකට දින පහක් සහ ඉතිරි කාලයේ දී සතියකට දින තුනක් (5*60*3)+15 |

**අන්තර්ක්‍රියාකාරීත්ව ජංගම සේවය (1977)**

අන්තර් ක්‍රියාකාරීත්ව ජංගම දුරකථන ප්‍රතිචාර සේවාව තුළින් (කෙටි කේතාංක 1977) පුරවැසියන් වෙත සිල්ලර මිල තොරතුරු ලබා දෙනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් ස්වකීය කෙටි කේතාංක දුරකථන අංකය වන 1977 භාවිතාකර සිල්ලර වෙළඳපොළවල එළවළු, පළතුරු සහ ආහාර ද්‍රව්‍ය සිල්ලර මිල ගණන් දෛනිකව මෙම තොරතුරු පද්ධතියට අඛණ්ඩව ඇතුළත් කරන ලදී. (කොළඹ, පිටකොටුව, දෙමටගොඩ, බොරැල්ල, නුගේගොඩ සහ වැල්ලවත්ත). පැලියගොඩ මාළු වෙළඳපොළෙන් මාළු මිල ගණන් ලබා ගැනේ. මෙම දත්ත දෛනිකව අදාළ පද්ධතියට ඇතුළත් කරනු ලැබේ. මෙමඟින් පාරිභෝගිකයන්ට තමන්ට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ දී දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගතහැකිය.

**වෙනත් නියාමන අධිකාරීන් සහ පාර්ශවකාර සංවිධාන සමඟ ඵලදායී සම්බන්ධතා ඇතිකරගැනීම සහ පවත්වා ගැනීම**

**01) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය**

**අ . පරිසර ආරක්ෂණය සඳහා වන අමාත්‍යාංශ කමිටු**

- ජාතික මෙහෙයුම් කමිටුව (Basel / Rotterdam / Stockholm conventions / Minamata convention)
  - ජාතික සම්බන්ධීකරණ කමිටු
  - ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ
  - ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති කමිටුව
  - ගෝලීය සුසංවාදීකරණ පද්ධති සමාලෝචන කමිටුව (HS කේතාංකය )
  - අන්තර් ආයතන විශේෂඥ කාර්ය කණ්ඩායම (IAEWG) – SWITCH ASIA වැඩසටහන
  - තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය

**ආ. මධ්‍යම පරිසර අධිකාරිය**

ශබ්දය සහ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ක්‍රියාත්මක සැලසුම සමාලෝචනය කිරීමේ කමිටුව.

- TACMIC – කාර්මික රසායනික කළමනාකරණය සඳහා වන තාක්ෂණික උපදේශන කමිටුව

02) **ජන සන්නිවේදන සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය**

GIC 1919 සඳහා වන මෙහෙයුම් කමිටු සාමාජික (PSC)

03) **ශ්‍රී ලංකා රේගුව**

රේගුවේ තනි කවුළු පද්ධතිය සමඟ සම්බන්ධ වීම.

04) **වෙළෙඳ සංගම් සහ කර්මාන්ත මණ්ඩල**

තරඟකාරීත්වය සහතිකකිරීම කර්මාණ්ත වලට සහයෝගය ලබා දීම පිණිස මිත්‍රශීලී සම්බන්ධතා පවත්වාගැනීම

**05) සෞඛ්‍ය අමාත්‍යාංශය**

**01.** ආහාර උපදේශක කමිටු සාමාජික

**ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA)**

02. දේශසීමා නිෂ්පාදන ඇගයීම් කමිටු සාමාජික

**ජාතික ඖෂධ නියාමන අධිකාරිය**

03. රූපලාවන්‍ය ද්‍රව්‍ය ඇගයීමේ උප කමිටුව

**ජාතික ඖෂධ නියාමන අධිකාරිය**

**06) ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

ප්‍රතිපත්ති උපදේශක කමිටුව

**07)** ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

ආහාර නිෂ්පාදන පිළිබඳ ආංශික කමිටුව

ISO-Copolco කමිටුව

ජාතික විද්‍යුත් තාක්ෂණ කමිටුව

**08) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

උපදේශක කමිටු රැස්වීම

**09) ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය**

මෙහෙයුම් කමිටුව

**10) පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කාර්මික පළිබෝධනාශක උප කමිටුව

**11) අපනයන සංවර්ධන මණ්ඩලය**

ජාතික අපනයන ක්‍රමෝපාය

**12) ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය**

නිෂ්පාදන සහතිකකිරීමේ උපදේශක කමිටුව

**13) මුදල් අමාත්‍යාංශය**

ජීවන වියදම් කමිටු රැස්වීම

**සාධාරණ මිලකරණය සහතිකකිරීම**

**අ. නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය**

පනතෙහි 18, 19 සහ 20 වගන්ති මඟින් පවරා ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හඳුනාගත් භාණ්ඩවල වෙළෙඳපොළ මිල සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කරයි. තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත අංක 7 වගුව මඟින් දැක්වේ.

**වගු අංක – 7 - තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග**

| භාණ්ඩය | ගන්නා ලද පියවර |
|---|---|
| ගෑස් | ගෑස් සඳහා වන අයදුම්පත්‍ර 06 කට තීරණ ලබාදී ඇත. |
| සිමෙන්ති | සිමෙන්ති සඳහා වන අයදුම්පත්‍ර 31 කට තීරණ ලබාදී ඇත. |
| යොදය සහිත කිරිපිටි | යොදය සහිත කිරිපිටි සඳහා වන අයදුම්පත්‍ර 12 කට තීරණ ලබාදී ඇත. |
| තිරිඟු පිටි | තිරිඟු පිටි සඳහා වන අයදුම්පත්‍ර 01 කට තීරණ ලබාදී ඇත. |
| කුකුළු මස් | කුකුළු මස් සඳහා වන අයදුම්පත්‍ර 01 කට තීරණ ලබාදී ඇත. |

**අතුරු නියෝග**

| භාණ්ඩය | අයදුම්පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| සිමෙන්ති | 15 |
| යොදය සහිත කිරිපිටි<br>ළදරු කිරිපිටි | 05<br>01 |
| ගෑස් | 07 |
| තිරිඟු පිටි | 01 |
| කුකුළු මස් | 02 |

**ආ . ආයතනය තුළ ශක්‍යතා සංවර්ධනය**

**අ. සේවක සංවර්ධනය**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සේවකයින් අදාළ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය වීම ස්වකීය සේවාවන් ඉහළ නැන්වීම සඳහා දායකත්වය සපයන ආයෝජනයක් වශයෙන් සලකනු ලැබේ. 2018 වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත වගු අංක 8 මඟින් දැක්වේ.

වගු අංක **– 8 - 2018** වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන වැඩසටහන්

| # | පාඨමාලාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විමර්ශන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 213 |
| 02 | නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සම්මන්ත්‍රණය:වෙළඳාම සහ ආයෝජනය යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද? | 01 |
| 03 | කම්කරු ආරවුල් විසඳීම පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 04 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 |
| 05 | "මූල්‍ය ප්‍රකාශන කියවීම සහ අවබෝධකරගැනීම" පිළිබඳ වැඩමුළුව | 01 |
| 06 | "මූල්‍ය පකාශන කියවීම සහ අවබෝධකරගැනීම" පිළිබඳ වැඩමුළුව | 01 |
| 07 | ශ්‍රී ලංකා ප්‍රමිති පිළිබඳ සම්මන්ත්‍රණ මාලාව 2018 | 01 |
| 08 | නව බදු නීතිය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 09 | "ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි" පිළිබඳ වැඩමුළුව | 01 |
| 10 | "ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි" පිළිබඳ වැඩමුළුව | 01 |
| 11 | වැටුප් කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 12 | වැටුප් කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 13 | AAT සමුළුව – 2018 | 01 |
| 14 | රාජ්‍ය සංස්ථා සඳහා අභ්‍යන්තර විගණන පුහුණු වැඩසටහන | 01 |
| 15 | VAT, NBT,ESC සහ මූල්‍ය කෙටුම්පත සඳහා වන ප්‍රධාන සංශෝධන පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 16 | VAT, NBT,ESC සහ මූල්‍ය කෙටුම්පත සඳහා වන ප්‍රධාන සංශෝධන පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 17 | "ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීම් ක්‍රියාවලිය" පිළිබඳ වැඩමුළුව | 01 |
| 18 | "ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීම් ක්‍රියාවලිය" පිළිබඳ වැඩමුළුව | 01 |
| 19 | තොරතුරු තාක්ෂණ මිලදී ගැනීම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 01 |
| 20 | තොරතුරු තාක්ෂණ මිලදී ගැනීම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 01 |
| **මුළු පාඨමාලා සංඛ්‍යාව** | | **232** |

ආ. අධිකාරියේ සේවක මණ්ඩලය ශක්තිමත්කිරීම

<u>කාර්ය මණ්ඩල තොරතුරු</u>

| තනතුර | වැටුප් කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | වර්තමාන කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|
| | | | ස්ථිර | තාවකාලික / කොන්ත්‍රාත් පදනම මත |
| **ජ්‍යෙෂ්ඨ කළමනාකරු** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | **HM 2-1** | **1** | **1** | **0** |
| අධ්‍යක්ෂවරු / සභා ලේකම් | **HM 1-1** | **7** | **5** | **0** |
| **කළමනාකරු** | | | | |
| අභ්‍යන්තර විගණක | **MM 1-1** | **1** | **1** | **0** |
| නියෝජ්‍ය අධ්‍යක්ෂවරු | | **12** | **2** | **0** |
| සහකාර අධ්‍යක්ෂවරු | | | **4** | **0** |
| නියෝජ්‍ය අධ්‍යක්ෂවරු / නියෝජ්‍ය අධ්‍යක්ෂවරු / ප්‍රාදේශීය කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂවරුන් | | **12** | **7** | **0** |
| නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ආයතනික සන්නිවේදනය) | | **1** | **0** | **0** |
| **කනිෂ්ඨ කළමනාකරු** | | | | |
| විගණන නිලධාරී | **JM 1-1** | **2** | **2** | **0** |
| පද්ධති පාලක | | **1** | **0** | **0** |
| ජ්‍යෙෂ්ඨ පරීක්ෂණ නිලධාරී | | **27** | **24** | **0** |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන නිලධාරී | | **1** | **0** | **0** |
| ජ්‍යෙෂ්ඨ වෙළඳ පර්යේෂක සහ විශ්ලේෂක | | **1** | **0** | **0** |
| ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී | | **2** | **1** | **0** |
| රහස්‍ය ලේකම් (සභාපති) | | **1** | **1** | **0** |
| රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජනරාල්) | | **1** | **0** | **0** |
| ජ්‍යෙෂ්ඨ පරිපාලන / මානව සම්පත් නිලධාරී | | **1** | **1** | **0** |
| ජ්‍යෙෂ්ඨ නීති සහ බලාත්මකකිරීමේ නිලධාරී | | **2** | **1** | **0** |
| ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී | | **1** | **1** | **0** |
| **බලගැන්වීම් / මෙහෙයුම්/ සේවා දිගු** | | | | |
| දත්ත සම්බන්ධීකාරක | **MA 5-2** | **1** | **0** | **0** |
| සංඛ්‍යාලේඛන නිලධාරී | | **1** | **1** | **0** |
| වෙළඳපොළ පර්යේෂණ විශ්ලේෂක | | **1** | **1** | **0** |
| ප්‍රලේඛන නිලධාරී II | | **6** | **4** | **0** |
| පුස්තකාලයාධිපති | | **1** | **1** | **0** |
| පිරිවැය නිලධාරී | | **15** | **2** | **0** |
| ගිණුම් නිලධාරී | | | **9** | **0** |
| පරිපාලන නිලධාරී II | | **5** | **3** | **0** |
| නීති සහ බලගැන්වීම් නිලධාරී | | **6** | **5** | **0** |

| | | | | |
|---|---|---|---|---|
| විර්ශන නිලධාරීන් | | 450 | 406 | 0 |
| මාධ්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත) | | 1 | - | 0 |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණ)** | | | | |
| පොත්තබන්නා | MA 2-2 | 1 | 0 | 0 |
| ඡායාරූප ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) | | 1 | - | 0 |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** | | | | |
| කළමනාකරණ සහකාර | MA 1-2 | 50 | 46 | 1 |
| කළමනාකරණ සහකාර (සරප්) | | 1 | 1 | 0 |
| **ප්‍රාථමික මට්ටම (ශිල්පීය)** | | | | |
| රියදුරු | PL 3 | 28 | 26 | 1 |
| **ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන)** | | | | |
| කාර්යාල සහායක | PL 1 | 24 | 22 | 0 |
| කාර්යාල සහායක (කොන්ත්‍රාත් පදනම මත) | | 1 | - | 0 |
| මුළු සංඛ්‍යාව | | 667 | 578 | 2 |

**ඇ. කාර්යමණ්ඩල අභිප්‍රේරණය සහ ශුභසාධනය**

සමාලෝචිත වර්ෂය තුළදී සේවකයින්ට ප්‍රසන්න මෙන්ම සේවයට හිතකර වාතාවරණයක් සැපයීම සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, ආගමික සහ සංස්කෘතික වැඩසටහන්, සේවක දිරිදීමනා ක්‍රමය , සේවක සංවර්ධන වැඩසටහන් සහ සේවක හඳුනාගැනීම් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**ඇ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත සඳහා සංශෝධන**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ දී උපදේශනයන් පැවැත්වුණු අතර අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් ලැබිණි.

## පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර, අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමුකිරීම්, ප්‍රධාන වශයෙන් ප්‍රති තරඟකාරීත්ව චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මඟින් බලය පවරා තිබේ. පනතේ විධිවිධාන ප්‍රකාර අධික මිල ගණන්, වෙළෙඳපොළ අඩුපාඩු සහ වෙළෙඳපොළ හැසිරවීම් විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිදී භාණ්ඩ අලෙවි කළයුතු මෙන්ම සේවා සැපයිය යුතු මිල ගණන් නිර්දේශ කිරීමට සභාව වෙත බලය පැවරී තිබේ.

**පැමිණිලි / නිර්දේශ**

| ක්‍රියාකාරකම | පැමිණිලි සංඛ්‍යාව | |
|---|---|---|
| | ලැබූ සංඛ්‍යාව | තීන්දුව ලබාදුන් / විසඳූ හෝ වාර්තා වූ සංඛ්‍යාව (පූර්ව වර්ෂය ද ඇතුළත්ව) |
| ජනතා අභිලාෂයට විරුද්ධව ක්‍රියාත්මක වන ප්‍රති තරඟකාරී ක්‍රියාකාරකම් සමනය කිරීම තහවුරු කිරීම. | 04 | - |
| භාණ්ඩ හා සේවා සඳහා උපරිම මිල නිර්දේශ කිරීම | 08 | නිර්දේශ ලද - 04 |
| අධික මිල ගණන් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීම | 03 | නිර්දේශ ලද - 01 |

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
## 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2018.12.31 දිනට රුපියල් 000' | 2017.12.31 දිනට රුපියල් 000' |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 70,602 | 52,317 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 31,280 | 31,972 |
| භාණ්ඩ ලැයිස්තු / තොග | 2,122 | 1,062 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 10,481 | 7,215 |
| | **114,485** | **92,565** |
| ක්‍රියාත්මක කාර්යයන් (සංවර්ධන පියවර) | 275 | 121 |
| ජංගම නොවන වත්කම් | | |
| ආයෝජන | 275,777 | 230,520 |
| පාරිතෝෂික අරමුදල ආයෝජන ගිණුම | 31,530 | 20,633 |
| ජංගම නොවන වෙනත් මූල්‍ය වත්කම් (කාර්ය මණ්ඩල ණය) | 18,370 | 12,864 |
| කුළියට දෙන ලද ගොඩනැඟිලි | 800 | 825 |
| දේපළ, පිරියත සහ උපකරණ | 87,830 | 67,351 |
| | **414,308** | **332,193** |
| **මුළු වත්කම්** | **529,068** | **424,879** |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | **-** | |
| උපචිත වියදම් | 46,904 | 39,716 |
| ගෙවියයුතු සහ අනෙකුත් වගකිම් | 10,679 | 12,255 |
| | **57,583** | **51,971** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 67,927 | 49,430 |
| **මුළු වගකීම්** | **125,509** | **101,401** |

| | | |
|---|---|---|
| **මුළු ශුද්ධ වත්කම්** | **403,559** | **323,478** |
| **<u>ශුද්ධ වත්කම්/ හිමිකම්</u>** | **-** | |
| සමුච්චිත අරමුදල | 63,191 | 63,191 |
| විලම්භිත ආදායම | 35,017 | 53,354 |
| සංචිත | 305,351 | 206,933 |
| | **403,559** | **323,478** |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | **403,559** | **323,478** |

මූල්‍ය ප්‍රතිපපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි පූර්ණ කොටසක් වේ. මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ව ගකීම් දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ  මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන  ලදී.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ මූල්‍ය | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | 2018.12.31 දිනට රුපියල් | 2017 .12.31 දිනට රුපියල් |
|---|---|---|
| | **000'** | **000'** |
| **ආදායම්** | | |
| පුනරාවර්තනප්‍රදාන | 489,982 | 380,652 |
| දඩමුදල් මඟින් ලද ආදායම් | 32,910 | 32,758 |
| වෙනත් ආදායම් | 58,599 | 58,356 |
| | **581,491** | **471,767** |
| **වියදම්** | | |
| පුද්ගල වේතන | (373,509) | (247,527) |
| ප්‍රවාහන | (13,433) | (11,406) |
| සැපයුම් සහ පරිභෝජන | (10,582) | (11,420) |
| නඩත්තු කටයුතු | (8,734) | (7,092) |
| ගිවිසුම්ගත සේවා | (54,012) | (53,648) |
| ක්ෂයවීම් | (27,466) | (33,608) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (34,003) | (43,896) |
| මූල්‍ය පිරිවැය | (150) | (57) |
| මුළු වියදම් | **(521,889)** | **(408,654)** |
| **කාල පරිච්ඡේදය සඳහා පූර්ණ ශුද්ධ අතිරික්තය /(හිඟය)** | **59,602** | **63,113** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | |
| ප්‍රත්‍යාගණන ලැබීම් | 38,815 | |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | **98,417** | **63,113** |

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. 000' | රු. 000' |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාවලින් ලද අතිරික්තය/ (හිඟය) | **59,602** | **63,113** |
| **ගැළපුම්** | | |
| ක්ෂයවීම | 27,466 | 33,608 |
| පාරිතෝෂිකප්‍රතිපාදන | 20,603 | 6,570 |
| ක්‍රමක්ෂය | 25 | 25 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **107,696** | **103,316** |
| ගෙවීම් ඉහළයාම - සටහන I | 5,612 | 5,399 |
| වෙනත් ජංගම වත්කම් ඉහළයාම - සටහන II | (3,634) | (15,309) |
| පාරිතෝෂික ගෙවීම් | (2,106) | (2,720) |
| අස්පෘශ්‍ය වත්කම් පහළයාම (ක්‍රියාත්මක වන කාර්යයන්) | (154) | |
| **ආයෝජන කටයුතු මඟින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **107,414** | **90,686** |
| **ආයෝජන කටයුතු මඟින් ලද මුදල් ප්‍රවාහ** | | |
| පිරියත සහ උපකරණ මිලදීගැනීම | (9,802) | (14,835) |
| පාරිතෝෂිත අරමුදලෙහි ආයෝජනය | (10,898) | (1,896) |
| ආයෝජන ඉහළයාම් | (45,257) | (12,025) |
| දීර්ඝ කාලීන ණය අඩුවීම් - (සේවක ණය) | (5,507) | (6,530) |
| **ආයෝජන කටයුතු මඟින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **(71,464)** | **(35,286)** |
| **මූල්‍ය කටයුතු මඟින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන - ප්‍රාග්ධන | 9,801 | 15,171 |
| ක්ෂයවීම් | (27,466) | (33,608) |
| විලම්භිත ආදායම | (17,665) | (18,437) |
| **මුදල් හා මුදල් සමාන ද්‍රව්‍යයන්හි ශුද්ධ ඉහළයාම් (පහළයාම)** | **18,285** | **36,963** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **52,317** | **15,354** |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **70,602** | **52,317** |
| | - | |

**<u>මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්</u>**

| | 2018<br>රු.000' | 2017<br>රු. 000' |
|---|---:|---:|
| **සටහන I** | | |
| **<u>ගෙවිය යුතු මුදල්</u>** | | |
| උපචිත වියදම් | 7,188 | (4,656) |
| ගෙවිය යුතු වියදම් | (1,576) | 10,055 |
| **ගෙවිය යුතු මුදල් වැඩිවීම** | **5,612** | **5,399** |
| **සටහන II** | | |
| **<u>වෙනත් ඩංගම වත්කම්</u>** | | |
| භාණ්ඩ වට්ටෝරුව / භාණ්ඩ තොගය | (1,061) | (31) |
| කාර්යමණ්ඩල ණයගැතියන් (වෙනත් ජංගම මූල්‍ය වත්කම්) | (3,266) | (1,693) |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 693 | (13,585) |
| | - | |
| **වෙනත් ජංගම වත්කම් ඉහළයාම්** | **(3,634)** | **(15,309)** |

| **2018/12/31 දිනට හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය** | | | | |
|---|---|---|---|---|
| | | | | **රු.000** |
| **විස්තරය** | **ආස්ථිතයේ හිමිකරුවන්ට ආරෝපණය කළ හැකි** | | | |
| | **දායක ප්‍රාග්ධනය** | **සමුච්චිත අතිරික්තය/ හිඟය** | **ප්‍රත්‍යාගණන අතිරික්තය** | **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** |
| **2018/01/01 දිනට ශේෂය** | **53,354** | **282,135** | **-** | **335,489** |
| නැවත ඇස්තමේන්තුගතකරන ලද ලාභය2014/2015) | | (12,011) | | **(12,011)** |
| **නැවත දක්වන ලද ශේෂය** | **53,354** | **270,124** | | **323,478** |
| **ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් 2018** | | | | |
| දායකත්වය - භාණ්ඩාගාරය (ප්‍රාග්ධන) | 9,801 | | | **9,801** |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂයවීම | (28,137) | | | **(28,137)** |
| වර්ෂය සඳහා අතිරික්තය / හිඟය | | 59,602 | | **59,602** |
| වාහන ප්‍රත්‍යාගණනය සහ වෙනත් | | | 38,815 | **38,815** |
| **2018/12/31 දිනට ශේෂය** | **35,018** | **329,726** | **38,815** | **403,559** |

# ගිණුම්කරණ සටහන්

**1. ආයතනික තොරතුරු**

**1.1** 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත , 1987 අංක 1 දරන පාරිභෝගික සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිල පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 203 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරි පනත යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 වන දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක.PED/58/02 ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය "A" කාණ්ඩයේ නියාමන නියෝජිතායතන අතර "A" උප කාණ්ඩයට අයත්වේ.

**1.2 ප්‍රමුඛ කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය**

අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ පාරිභෝගිකයින් සහ වෙළඳාම සම්බන්ධ රෙගුලාසි ආරක්ෂා කිරීමයි.

**1.3** 2018 වර්ෂය අවසාන වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාව 580 ක් විය.

**1.4 සුවිශේෂී කොටස් හිමිකාරීත්වය / හිමිකම්**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදලින් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත ඍජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදල ඇතිකරන ලද අරමුදලේ ශුද්ධ ශේෂය මඟින් ද අධිකාරියේ හිමිකම් නිරූපණය කෙරේ.

**1.5 රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් පවතින විට එය රජයේ ප්‍රදානයක් වශයෙන් හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයට සම්බන්ධයක් පවතී නම් එය වර්ෂය සඳහා වන ආදායම වශයෙන් හඳුනාගැනේ. ප්‍රදානය වත්කමක් හා සම්බන්ධ වන්නේ නම් අදාළ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ජීවකාලයට සමාන අගයක් ආදායම වශයෙන් සලකනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිණිබඳ අධිකාරිය විසින් මුල්‍යමය නොවන ප්‍රදාන ලබන විට වත්කම සහ ප්‍රදානය නාමික අගයන් වශයෙන් ගැනෙන අතර සමාන වාර්ෂික වාරික වශයෙන් අදාළ වත්කම ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය අනුව අපේක්ෂිත ජීවකාලය තුළ ලාභ හෝ අලාභ වශයෙන් නිදහස් කෙරේ. සාධාරණ අගයක් සහිත වත්කම් හා සම්බන්ධ රජයේ ප්‍රදාන සහ මුදල් නොවන ප්‍රදාන ශේෂ පත්‍රයෙහි ක්ෂය වූ ආදායම වශයෙන් දැක්වේ.

**2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට (SLPSAS) අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

**2.2** ඓතිහාසික පිරිවැය පදනම සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීමෙහි අනාගත හඳුනාගැනීම අනුව මූල්‍ය ඇස්තමේන්තු සකස් කර තිබේ.

**2.3 දඩ මුදල් ආදායම**

**2.3.1** අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් උපයෝගී කර නොගත් බැවින් ආදායම් ප්‍රකාශන සැකසීමේ දී දඩ මුදල් ආදායම සැලකිල්ලට නොගන්නා ලදී. දඩ මුදල් ආදායම පිළියෙළ කිරීමේ දී 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදී. එමනිසා දඩ මුදල් උපයනු ලබන ආදායමක් වශයෙන් සලකන ලද අතර දඩ මුදල් ආශ්‍රිත සියලු වියදම් සහ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා තිබේ.

**2.3.2** අධිකාරිය විසින් දඩ මුදල් වශයෙන් ආදායම් වශයෙන් මුදල් ලැබුවද අදාළ වැටලීම සිදුකළ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරි නිලධාරියා විසින් ලබා දෙන ලද නඩු අංක සහ මුදල් එවීමේදී අදාළ අධිකරණය විසින් ලබාදෙනු ලබන අංක (තොරතුරු) එකිනෙකට වෙනස්වීම හේතුවෙන් ඒවා එම අවස්ථාවේදී ම දඩ මුදල් වශයෙන් හඳුනා නොගැනෙන අවස්ථා පවතියි. එම මුදල් සත්‍ය

වශයෙන්ම අධිකාරිය සතුවියයුතු මුදල් ද නැතහොත් අධිකරණ විසින් වැරදීමකින් එවන ලද ඒවාද යන්න සත්‍යාක්ෂණය කිරීම කාර්යය සඳහා සාමාන්‍යයෙන් විලම්බන - දඩ මුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. එබඳු මුදල් ඊ ළඟ වර්ෂය අවසන් වනතෙක් හඳුනා නොගන්නේ නම් අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

**2.3.3** පූර්ව වර්ෂයන්හි අත්දැකීම් අනුව, හඳුනා නොගත් දඩ මුදල් ආදායමෙන් ඉතා ඉහළ ප්‍රමාණයක් ලැබියයුතු දඩ මුදල් වශයෙන් නිරූපණය විය.

**2.4** **මුදල් වර්ෂය**

අධිකාරියේ මූල්‍ය වර්ෂය ලෙස දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය සලකනු ලැබේ.

**3.** **වත්කම් පදනම් සහ ඒවායේ අගය තක්සේරු කිරීම**

**3.1** **දේපළ, පිරියත සහ උපකරණ**

**3.1.1.** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගිණුම් ඇස්තමේන්තු සැකසීම සඳහා ගිණුම් ප්‍රතිපත්ති සහ අනාගත හඳුනාගැනීම ලෙස පිරිවැය ආකෘතිය තෝරාගනියි. (SLPSAS 7)

**3.1.2** දේපළ, පිරියත සහ උපකරණ ආදියෙහි අගය දැක්වීමේ දී ඒවායේ ශුද්ධ සමුච්චිත ක්ෂයවීමට දේපළ, පිරියත සහ උපකරණ කොටස් ප්‍රතිස්ථාපනය කිරීම ද අන්තර්ගත වේ. දේපළ, පිරියත සහ උපකරණ ආදියෙහි අතිශය වැදගත් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට ඇතිවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස පිළිනොගෙන නව කොටස ආශ්‍රිත ජීවකාලය සහ ක්ෂයවීම හඳුනා ගනියි. අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඒවා වැය කරන ලද ආකාරය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.
ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වත්කම් ප්‍රත්‍යාගණ සංචිතයෙහි සමුච්චිත හිමිකම් වශයෙන් දැක්වේ.

**3.1.3** වත්කම් අපේක්ෂිත ක්‍රියාකාරී තත්ත්වයට අවශ්‍ය පරිදි සකස් කිරීම සඳහා ඕනෑම වියදමක් දරමින් සිදු කරනු ලබන මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් සඳහා වන පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ සඳහා වැය වන පිරිවැය වේ.

**3.1.4** කාර්යයන් ක්‍රියාත්මකකිරීම හෝ වත්කම්වල ජීවකාලය ඉහළ නැන්වීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම, පුළුල්කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම වශයෙන් සලකනු ලැබේ.

**3.1.5** අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා ස්වකීය ශුන්‍ය වටිනාකම් සහිත වත්කම් සඳහා ප්‍රත්‍යාගණන ආකෘතියක් අනුගමනය කරන ලදී. ශුන්‍ය වටිනාකම් සහිත වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පත් කරන ලද කමිටුව පහත සඳහන් තීරණ ගෙන තිබේ.

1. වසර අවසානයේදී වෘත්තීය වටිනාකමකින් වාහන ඔවුන්ගේ වෙළඳපල වටිනාකමට නැවත තක්සේරු කර තිබේ.

2. කුලී ගොඩනැගිල්ල තුළ අධිකාරිය පවත්වාගෙන යන බැවින් සහ කාර්යාල ගොඩනැගිල්ල වෙනස් කරන විට හෝ ඉවත් කරන විට කොටස්වලට සැලකිය යුතු මූල්‍යමය වටිනාකමක් නොමැති බැවින්, 2019 වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි කාර්යාල කොටස් කපා හරිනු ලැබේ.

3. උපලේඛන VII-I හි හඳුනාගෙන ඇති උප ශුන්‍ය වටිනාකම් සහිත වත්කම්වල භාවිතා කළ හැකි වටිනාකමක් සහ භාවිතා කළ හැකි තත්වයක් නොමැත.

4. හඳුනාගත් ශුන්‍ය වටිනාකම් සහිත වත්කම් සාධාරණ අගය මත පදනම්ව නැවත ඇගයීමට ලක් කෙරේ.

පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ගිණුම් ප්‍රත්‍යාගණනය සමඟ සමානුපාතිකව නැවත ආරම්භ කරනු ලැබේ. අනෙකුත් සියලුම දේපල, පිරියත සහ උපකරණ පිරිවැය ආකෘතිය යටතේ ගණනය කෙරේ.

**3.1.6** **ක්‍රියාත්මක වන කාර්යයන්** මෘදුකාංග වැඩිදියුණුකිරීම සහ ක්‍රියාත්මකකිරීම සඳහා මෙම මුදල් වියදම් කළ ඇති බව මෙමඟින් දැක්වේ.

| | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.) | අවසන් කළ කාර්යයන් (රු.) (WIP) | 2018.12.31.දිනට සහතික කළයුතු ශේෂය (රු.) |
|---|---|---|---|
| වැටුප් පැකේජය | 550,000.00 | 275,000.00 | 275,000.00 |
| **එකතුව** | **550,000.00** | **275,000.00** | **275,000.00** |

**3.2** **ක්ෂයවීම්**
සියලුම වත්කම් අධිකාරියේ භාවිතයට යොදාගත් දිනෙන් ආරම්භ වන මාසයේ සිට ක්ෂය ගණනය කරනු ලැබේ.

**3.2.1** දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ජීවකාලය මත පිරිවැය කපාහැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට ගැළපෙන පරිදි ක්ෂය ප්‍රතිපාදන සලසා තිබේ.

| | |
|---|---|
| කාර්යාල ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යල උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග සහ වෙබ් නිර්මාණ (අස්පෘශ්‍ය වත්කම්) | 20% |
| මෝටර් වාහනය | 20% |
| කාර්යාල බෙදා වෙන්කිරීම් | 20% |
| පාරිභෝගික නොවන භාණ්ඩ | 10% |

**3.2.2** ක්ෂය ගණනය කිරීම් සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඍජු ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

**3.2.3** පුස්තකාල පොත් සඳහා ක්ෂය කිරීම් සිදුකර නොමැත.

**3.2.4** සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂයකිරීම් විලම්භිත ආදායම් ගිණුමට බැර කරනු ලැබේ.

**3.3** **ගොඩනැඟිලි පරිශ්‍ර - කුරුණෑගල**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැඟිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 01 ක මුදල ගෙවීම වර්ෂ 40 කට වැඩි කාලයක් සඳහා ක්‍රමක්ෂය වී තිබේ.

**3.4** **ණය ගැතියන් සහ ලැබියයුතු මුදල්**
ණයගැතියන් සහ ලැබියයුතු මුදල් ලැබිය යුතු ඇස්තමේන්තුගත ප්‍රමාණය අනුව දක්වා තිබේ.

**3.6** **මුදල් හා මුදල් සමාන දෑ**
අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, සහ කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් අර්ථ දැක්වේ.

**3.6.1** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දේ යටතට අතැති මුදල් සහ බැංකු තැම්පතු අන්තර්ගත වේ.

**3.7** **ස්ථාවර තැන්පතු**
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි ස්ථිර තැන්පතු ආයෝජන යටතේ වර්ග කරනු ලැබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අත්දැකීම් අනුව ස්ථිර තැන්පතු අදාල කාලපරිච්ඡේදය තුලදී ආපසු ලබාගෙන නොමැති අතර ස්ථිර තැන්පතු බහුතරයක් අවම වශයෙන් වසර තුනක් පවතින බවට උපකල්පනය කළ හැකිය. මූලික වශයෙන් ස්ථිර තැන්පතු අගය මත ගණනය කරනු ලැබේ.

**4.** **වගකීම් සහ ප්‍රතිපාදන**

**4.1 ගෙවියයුතු මුදල්**

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය මත සඳහන් කර තිබේ.

**4.2 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිශ්චිත විශ්‍රාමික දීමනා සැලසුම් ක්‍රම දෙකක් ඇති අතර එම ක්‍රම දෙක සඳහාම දායකත්වය දැරියයුතුය.

**4.2.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකය**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් නිශ්චිත දායකත්ව සැලැස්මකට වඩා පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. 2018 සිට LKAS 19 – "සේවක ප්‍රතිලාභ" ප්‍රකාරව සියලුම සේවකයන් සඳහා සූත්‍ර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂික වගකීම ගණනය කරන ලදී. සේවක ප්‍රතිලාභ මත LKAS 19 ට අනුකූලව සේවයේ ආරම්භයේ සිටම විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා තිබේ. කෙසේ නමුත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතන සඳහා සේවකයෙකු සම්බන්ධයෙන් වගකීම ඇති වන්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

නිශ්චිත ප්රතිලාභ බැඳීමෙහි වර්තමාන අගය තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවීම සඳහා නම් කරන ලද මුදල් වර්ගයෙහි පොළී අනුපාත (වර්ෂාවසාන භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය) භාවිතයෙන් ඇස්තමේන්තුගත ඉදිරි මූල්‍ය ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි. තවද ආශ්‍රිත වගකීමෙහි කොන්දේසි වලට ආසන්න වශයෙන් මුහුකුරායාම ද මීට අදාළ වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් සූත්‍ර පදනමක් මත තීරණය වන සාධක ගණනාවක් මත තීරණය වේ.

2018 දෙසැම්බර් 31 දින වන විට සියලුම සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ වගකීම රු. 67,926,740.35 කි. නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ. මෙම උපකල්පනයන්හි කිසියම් වෙනස්කමක් නිහ්චිත ප්‍රතිලාභ බැඳීම්වලට බලපානු ඇත.

| | **2018** |
|---|---|
| පොළී වට්ටම් අනුපාතය | 11.88% |
| වැටුප් වැඩිවීම් අනුපාතය | 12.00% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය | 7.00% |
| විශ්‍රාම ගැනීමේ වයස | අවුරුදු 60 |

පාරිතෝෂික ප්‍රතිපාදන වෙන් වශයෙන් ආයෝජනය කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අනුමැතිය ලබාගෙන ඇත. සේවා කාලය වසර පහකට වැඩි සේවකයින් සඳහා පාරිතෝෂික සඳහා ආයෝජනය ගණනය කර ඇත. පහත දැක්වෙන්නේ 2018/12/31 දිනට පාරිතෝෂික ආයෝජනයේ සාරාංශය සහ ආයෝජනය කළ යුතු ශේෂයයි.

| | | |
|---|---|---|
| 2018.12.31 දිනට සේවා කාලය වසර පහට වැඩි සේවකයින් සඳහා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 55,011,540.32 |
| 2018.01.01. දිනට ආයෝජන | 34,675,447.31 | |
| 2018 වර්ෂයේ ආයෝජන සඳහා පවතින ප්‍රතිපාදන (2019/02/28 දිනට 2018 වර්ෂය සඳහා ආයෝජන) | 20,336,093.01 | |
| **මුළු ආයෝජන** | | **55,011,540.32** |

**4.2.2 නිශ්චිත දායක මුදල් සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සියලුම සේවකයින් ස්වකීය සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත සේවකයින් ආවරණය කරමින් ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා දී තිබේ.

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදල් බලාධිකාරය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3% බැගින් වූ මුදලක් පිළිවෙළින් දායකකරගනු ලබයි.

**4.3 අවිනිශ්චිත වගකීම්**

2018.12.31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව ගොනු කර තිබූ නඩු සංඛ්‍යාව 47 ක් වූ අතර එම නඩු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතෙහි වගන්ති ප්‍රකාරව පහත සඳහන් පරිදි වර්ග කළහැකිය.

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 08 |
| අභියාචනාධිකරණය | 25 |
| මහාධිකරණය | 07 |
| දිස්ත්‍රික් අධිකරණය | 05 |
| කම්කරු විනිශ්චය සභාව | 01 |
| බේරුම්කරණය | 01 |
| එකතුව | 47 |

**4.3.1** පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා තාක්‍ෂණය පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ ව්‍යාපෘතියක් - නිශ්චිත හඳුනාගැනීමේ නිෂ්පාදන සඳහා ආරක්ෂාකාරී සෙවීම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිත සමාගම වන SICPA, ගිවිසුමට අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පද්ධතිය ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස පැන නැගී ඇති ආරවුලේ බේරුම්කරණය සඳහා අයදුම්පතක් ගොනු කර ඇත.

**ක්‍රියාත්මක නොකිරීමට හේතුව**

අංක 49 වන විධානය 2014/02/24 දින නිකුත් කිරීමෙන් පසුව නිශ්චිත නිෂ්පාදන කිරීම සබන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරය දැනුවත් කරන ලද අතර එහි විධාන පිළිබඳ සැලකිලිමත් ව සාකච්ඡා කිහිපයක් ද පවත්වා තිබේ. පැවති සාකච්ඡාව අසාර්ථක වූ බැවින්, ශ්‍රී ලංකාවේ බෝතල් කළ ජල සංගමය, පාන වර්ග සංගමය සහ රූපලාවණ්‍ය නිෂ්පාදකයින් විසින් 2014/08/14 දින අභියාචනාධිකරණයට (CAA / Writ / 281/2014) අභියාචනා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අතර එය මේ වන විටත් අභියාචනාධිකරණයේ තවමත් විභාග වෙමින් පවතී. SICPA විසින් රුපියල් බිලියන 2.716 හෝ විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම මුදලක් හෝ විකල්පයක් ලෙස රුපියල් බිලියන 2.7168 ක් හෝ විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම මුදලක් හා හෝ අතිරේක වශයෙන් රුපියල් බිලියන 3.887 ක් සහ හානි සඳහා හිමිකම් සහ බේරුම්කරණයේ සියලු පිරිවැය පිළිබඳ පොළිය ඉල්ලුම් කර තිබේ.

බේරුම්කරණ පිරිවැය මත පළාත් අත්තිකාරම්වල කොටසක් ලෙස ඇමරිකානු ඩොලර් 230,000 ක් ගෙවන ලෙස පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙතින් ඉල්ලා ඇත.

**5. ආදායම**

**ආදායම හඳුනාගැනීම**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ගලා ඒ යැයි අපේක්ෂා කරන ආදායම් ප්‍රමාණය හඳුනාගෙන ඇත්නම් ආදායම විශ්වාසදායක ලෙස මිනිය හැකිය.

**පොළී ආදායම**

නාමික පොළී අනුපාතය භාවිතා කර ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම ගණනය කර සටහන් කරනු ලැබේ (NIR). ස්ථිර තැන්පතු සඳහා පොළී අනුපාතය10.5% කි. එමනිසා, සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම පසුගිය වසරට වඩා පහළ අගයක් ගනියි.

**රජයේ ප්‍රදාන**

රාජ්‍ය ප්‍රදාන සාධාරණව හිමිවේ යයි සලකා සහ එයට අදාළ කොන්දේසි අනුකූලව ඇත්නම් එය රජයේ ආධාර වශයෙන් හඳුනාගැනේ. ප්‍රදාන වියදම් අයිතමයක් සේ සම්බන්ධයක් ඇත්නම් (පුනරාවර්තන ප්‍රදාන) එය එම කාලය සඳහා ආදායමක් ලෙස සලකයි. ප්‍රදාන වත්කම් අයිතමයක් සමඟ සම්බන්ධයක් ඇත්නම් (ප්‍රාග්ධන ප්‍රදාන) එය විලම්භිත ආදායමක් සේ සළකා අදාළ වත්කමෙහි ජීව කාලය පුරා අදායම සමාන අගයන්ගෙන් නිකුත් කෙරේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුදල් නොවන ප්‍රදාන ලබාගන්නා විට වත්කම් සහ ප්‍රදාන දළ වශයෙන් නාමික අගයන් සේ සලකා වත්කමෙහි ජීව කාලය පුරා වත්කම් ප්‍රකාශයට නිකුත් කෙරේ. (IAS 20)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඩී/සීඑජ්/1/18 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 ඔක්තෝබර් 25 දින

සභාපති,

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදීපාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2018 වර්ෂයේදී අධිකාරියේ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ලාභය රු.38,915,343 ක් වූ අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ හා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ආයෝජනය ක්‍රියාකාරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සේවක ප්‍රසාද දීමනා වශයෙන් රු.7,507,875 ක් 2019 වර්ෂයේදී ගෙවා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) අධිකාරියේ 2018 වර්ෂයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් ඉටු කරවා ගැනීමට අධිකාරිය විසින් ඉල්ලීමක් කර තිබුණද ඒ සඳහා දෙපාර්ශවය අතර එකඟතාවයන්ට එළඹ නොතිබියදී සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් රු.2,150,000 ක් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.ඒ හේතුවෙන් ජංගම වගකීම් හා පුහුණු කිරීම් හා සම්මන්ත්‍රණ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේපහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරිය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධිවිධානවලට යොමුව | විස්තරය |
| --- | --- |
| 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත<br>(අ) 8(ඌ) වගන්තිය | වෙළඳපල තත්ත්ව සහ පාරිභෝගික කටයුතු වලට අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පල කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම අධිකාරියේ එක් ප්‍රධාන කාර්යයක් වන අතර සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණේ එක් අධ්‍යනයක් පමණි. එම අධ්‍යයන වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර තිබුණු අතර අධිකාරිය විසින් එම වාර්තාවේ ඇතුළත් තොරතුරු සම්බන්ධයෙන් මහජනතාව දැන්වත් කිරීම ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 39(2) වගන්තිය | අදාල අමාත්‍යවරයා විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව සඳහා සමාජිකයන් තිදෙනෙකු පත් කළ යුතු වුවද 2018 දෙසැම්බර් 31 දින වන විට පත් කර තිබුණේ සමාජිකයන් දෙදෙනෙකු පමණි. පනතේ 19 වගන්තිය යටතේ සභාව වෙත යොමු කරන කරුණු සම්බන්ධයෙන් වන විමර්ශන කටයුතු මාස 02න් ඇතුළත නිමකර වාර්තා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2017 වර්ෂයේ ඉදිරිපත් කළ විමර්ශන කටයුතු 04ක් සම්බන්ධයෙන් විමර්ශන වාර්තා 2019 මාර්තු 31 දින වන විටත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර එහි ප්‍රමාද කාලය මාස 03 සිට අවුරුදු 1 ½ දක්වා පැවතුනි. |
| (ඇ) 61 (1) හා 61 (2) වගන්ති | යම් භාණ්ඩයක් ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවන බව විශ්වාස කිරීමට තරම් හේතු ඇති අවස්ථාවක භාණ්ඩ සාම්පල පරීක්ෂා කිරීම සඳහා අනුමත රස පරීක්ෂකවරයකු වෙත එම සාම්පල ඉදිරිපත් කිරීමට අධිකාරියට හැකියාව පවතී. රස පරීක්ෂකවරයා විසින් සිය වාර්තාව මාසයක් ඇතුළත අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී රු.563,407 ක් වැය කරමින් අනුමත රස පරීක්ෂකවරු වෙත යොමු කර තිබුණු භාණ්ඩ සාම්පල් 46 න් සාම්පල් 08 ක් සම්බන්ධ වාර්තා විගණිත දිනය වන 2019 ජනවාරි 31 දින වන විටත් ලැබී නොතිබුණු අතර සාම්පල් 03 ක වාර්තා නිසි කාලසීමාව තුල ලැබී නොතිබුණි. |

7

| | |
|---|---|
| (ඈ) 61 (1) (ආ) වගන්තිය | යම් භාණ්ඩයක සාම්පල ලබා ගැනීමෙන් පසු සති 06 ක නොඉක්මවන කාලයක් සඳහා ඒ භාණ්ඩය විකිණීම හෝ විකිණීම සඳහා අනාවරණය කිරීමෙන් වලකින ලෙසට ඒ සාදන්නාට හෝ වෙළෙන්දාට විධානයක් නිකුත් කල හැකි වුවද සමාලෝචිත වර්ෂයේදී ලබාගත් සාම්පල 46 න් සාම්පල 16 කට අදාලව රස පරීක්ෂක වාර්තාව අනුව ප්‍රමිතිවලට අනුකූල නොවූ හා අහිතකර ද්‍රව්‍ය අඩංගුව තිබුණු භාණ්ඩ සාම්පල සම්බන්ධයෙන් අධිකාරිය විසින් සාදන්නාට හෝ වෙළෙන්දාට එවැනි විධාන නිකුත් කර නොතිබුණි. |
| (ඉ) 13 වගන්තිය | පාරිභෝගිකයන් විසින් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සඳහා පරීක්ෂණ පැවැත්විය යුතු බව සඳහන් වේ. සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය වෙත පාරිභෝගික පැමිණිලි 2092 ක් ලැබී තිබුණු අතර ඉන් විසඳු හෝ විසඳා නොමැති පැමිණිලි සංඛ්‍යාව කොපමණද යන්න හඳුනාගැනීමට හැකි දත්ත පද්ධතියක් ක්‍රියාත්මකව නොපැවතුණු අතර 2016,2017 හා 2018 වර්ෂවලදී අධිකාරිය වෙතලැබුණු පැමිණිලි 13 ක් විගණිත දිනය වන විටත් විසඳා අවසන් කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවපහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අධිකාරියේ මානව සම්පත සාර්ථකව උපයෝගී කරගෙන තිබේද යන්න පරීක්ෂා කර ගැනීමේ අරමුණින් මානව සම්පත් විගණනයක් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනය සමඟ 2016 දෙසැම්බර් 02 දින ගිවිසුම් ගත වී තිබුණි. ඒ සඳහා එම ආයතනයට 2017 අප්‍රේල් 20 දින රු. 219,000 ක්වූ අත්තිකාරම් ගෙවා තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව අත්තිකාරම් ගෙවූ දින සිට මාස 03ක කාලයකදී කාර්යය නිමකල යුතු වුවද විගණන දින වන 2019 ජූලි 31දින විටත් එම කාර්යය නිම කර නොතිබුණි.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) පාරිභෝගිකයන්ට අධිකාරිය වෙත ක්ෂණිකව පැමිණිලි ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන් හා ගොවීන්ට වෙළඳසැල් තොග හා සිල්ලර මිල ගණන් දැන ගැනීම සඳහා 2013 වර්ෂයේදී රු.9,188,369ක් වැය කරමින් 1977 දුරකථන සේවාව ස්ථාපිත කර තිබුණි. මෙම සේවාව පැය 24 පුරා පාරිභෝගිකයින්ට පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකියාව පැවතියද, සමාලෝචිත වර්ෂයේදී මෙම සේවාව නිසි පරිදි ක්‍රියාත්මක නොවුණි.

(ආ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වනවිට වසර 15 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ විමර්ශණ නිලධාරීන් 193 කින් වැඩිවුවද, සමාලෝචිත වර්ෂයේදී වැටලීම් ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 6 කින් අඩුවී තිබුණි. තවද දිස්ත්‍රික්ක 10 ක වැටලීම් ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණු අතර එය සියයට 9 සිට සියයට 26 දක්වා පරාසයක පැවතුනි. මෙම දිස්ත්‍රික්ක 10 න් දිස්ත්‍රික්ක 06 කම අතිරික්ත නිලධාරීන් අනුයුක්ත කර තිබියදී මෙම පහත වැටීම සිදුවී තිබුණි.

(ඈ) කොළඹ,කළුතර,මාතර,රත්නපුර හා අනුරාධපුර දිස්ත්‍රික්කවල ජනගහණය හා වෙළඳසැල් ප්‍රමාණය අනෙකුත් දිස්ත්‍රික්කවලට වඩා වැඩි වුවද සමාලෝචිත වර්ෂයේදී එම දිස්ත්‍රික් කාර්යාල සඳහා ලබා දී තිබුණු වැටලීම් ඉලක්කයක් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැටලීම් 1010 කින් එනම් සියයට 16 කින් අඩු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ආනයනකරුවන් හා බෙදාහරින්නන්ගෙන් උපරිම මිල සහතික ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර 280 ක් අධිකාරිය වෙත ලැබී තිබුණු අතර එම අයදුම්පත්‍රවල සඳහන් ආයතන ඊට අදාල ගබඩා අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කර තිබුණේ අයදුම්පත්‍ර 89 ක් පමණි. එනම් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 32 ක් පමණි.

(ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012 අගෝස්තු 08 දින අනුමත කර තිබුණු අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසි සපුරා ගැනීමකින් තොරව අධිකාරි පනතේ 52 (1) වගන්තිය අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයාගේ 2018 සැප්තැම්බර් 14 දිනැති ලිපියෙන් එකඟතාවය මත සභාපතිවරයා විසින් 2018 සැප්තැම්බර් 14 දින සිට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් විමර්ශන නිලධාරීන් 214 ක් බඳවාගෙන තිබුණු අතර විගණිත දින වන 2019 අගෝස්තු 31 දින වන විටත් නිලධාරීන් 38 කට අදාලව ඔවුන්ගේ සුදුසුකම් අදාල ආයතන වලින් තහවුරු කරගෙන නොතිබුණු අතර දිස්ත්‍රික්ක කාර්යාලවල පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා එම නිලධාරීන් දිස්ත්‍රික්ක කාර්යාලවලට අනුයුක්ත කර තිබුණි.

(ඌ) විමර්ශන නිලධාරින් 406 ක් අධිකාරියේ එක් එක් දිස්ත්‍රික්ක කාර්යාල සඳහා අනුයුක්ත කිරිමේදී දිස්ත්‍රික්ක 08 ක නිලධාරින් 60 කගේ අතිරික්තයක්ද දිස්ත්‍රික්ක 16 ක නිලධාරින් 104 ක ඌනතාවයක් පවතින ලෙසට අනුයුක්ත කර තිබුණු අතර ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර තිබුණු විමර්ශන නිලධාරින් 98 කුගෙන් අධිකාරියේ කටයුතු ඉටු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව පිළිබඳව සභාපතිතුමාගේ අදහස් දැක්වීම**

1.2 (අ) 2018 වර්ෂයේ අධිකාරියේ ප්‍රත්‍යාගණ ලාභය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතට එකතුකර නැවත එම ප්‍රමාණය ආයෝජන ක්‍රියාකාරකම්වලින් අඩුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම නිසා සිදුවූ ප්‍රමාද දෝෂය 2019 සංසන්දනාත්මක මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල නිවැරදිකොට ඉදිරිපත්කර ඇත.

(ආ) සේවක ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය භාණ්ඩාගාරයෙන් ලබාගත යුතු අතර,2018 වර්ෂයේ මූල්‍ය ප්රකාශන විගණනයට ඉදිරිපත් කරන දිනය තෙක්ම එම අනුමැතිය පාරිභෝගික අධිකාරිය වෙත ලැබී නොතිබිණි. එම අනුමැතිය පාරිභෝගික අධිකාරියට ලැබී ඇත්තේ 2019/08/23 දිනය.ඒ අනුව 2018 මූල්‍ය ප්‍රකාශනවලට මෙම වෙන් කිරීම සඳහා ප්‍රමාණාත්මක තොරතුරු නොතිබුණ බැවින් එම වෙන් කිරීම කළ නොහැක. කෙසේ වෙතත් 2018 වර්ෂයේ ප්‍රසාද දීමනා වෙන් නොකිරීම් නිසා ඇතිවූ දෝෂය නිවැරදි කර 2019 සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කරන ලදී.

(ඇ) සේවක කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සඳහා අධිකාරිය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) සමඟ සාකච්ඡා කර නොමැති අතර ඒවා 2018 වර්ෂයේදී පැවැත්වීමට සංවිධානය කර නොතිබුණි. අවශ්‍ය වියදම රු. 2,150,000 ක් වන අතර එකී ආයතනයේ වගකීම සඳහා උපචිත වියදම් ලෙස එම මුදල වෙන් කරන ලෙස මුදල් අංශයට උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත්, එවැනි කාර්යක්ෂමතා තීරු විභාගයක් පැවැත්විය නොහැකි බව SLIDA පසුව දැනුම් දී ඇති අතර, ගිණුම් පිළිබඳ ප්‍රකාශ කිරීමට පෙර මුදල් අංශය දැනුවත් නොකිරීම නිසා මෙම තත්වය පැන නැගී ඇත. කෙසේ වෙතත්, අදාළ වෙන් කිරීම 2019 ගිණුම් වලින් නිවැරදි කර ඇත.වාර්තාවේ 1.2, 1.3, 1.4 සහ 2 වන ඡේදවල දක්වා ඇති විගණනය සඳහා වන වගකීම වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කර ඇත.

2. නීති / උපදෙස් වෙත යොමු කිරීම

(අ) අංක 8 (ඊ) වගන්තිය

මහජනතාව දැනුවත් කිරීම සඳහා, අධිකාරියේ වෙබ් අඩවිය සහ මුහුණු පොතෙහි සාරාංශ හා නිර්දේශයන් ප්‍රකාශයට පත් කිරීම සහ පත්‍රිකා තවදුරටත් සකස් කිරීම සහ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් මට්ටමේ ශාඛා වෙත යැවීම මගින් වාර්තාව මහජනතාව වෙත ලබා දීමට අධිකාරිය දැනටමත් පියවර ගෙන තිබේ. අධ්‍යක්ෂවරුන්ගේ.

(ආ) අංක (2) 39වගන්තිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාව සඳහා සියළුම සාමාජිකයින් වර්තමානයේ පත්කර ඇති බව සඳහන් කරමි. එම සභාව විසින් විමර්ශන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් 06 න් දැනටමත් වාර්තා දෙකක් එනම් සහල් සඳහා උපරිම සිල්ලර මිල සම්බන්ධ විමර්ශන කටයුතු සහ අභ්‍යාස පොත් සඳහා උපරිම සිල්ලර මිල සම්බන්ධ විමර්ශන කටයුතු සම්පූර්ණ කර ඇති අතරම ඉතිරි වාර්තා කඩිනමින් අවසන් කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

(ඇ) අංක 61 (1) සහ 61(2) වගන්තිය

සාම්පල පරීක්ෂාකර ඒවාට අදාළ වාර්තාවන් අවශ්‍ය කාල සීමාව තුළදී ලබාගැනිමට අධිකාරිය උපරිම උත්සාහ දරා ඇත. ඒ අනුව සාම්පල් 46 න් 38ක් අදාලකාල පරාසය තුල ලබාගැනීමට හැකිවිය.කෙසේ වෙතත් සමහර අවස්ථාවලදී යම් භාණ්ඩ සඳහා පිටස්තර රසායනාගාරවලින් එම වාර්තා ලබාගැනීමට නොහැකිවන්නේ එම රසායනාගාරවලට තිබෙන පරීක්ෂණ ඉල්ලීම් වැඩිවීම හේතුවෙන් සාම්පල ගොඩගැසී තිබීමය. මෙය අධිකාරියේ පාලනයෙන් පිටස්තරයින් සිදුවන කරුණක් බැවින් මෙයට සුදුසු පියවරක් ලෙස අධිකාරියටම අනුයුක්ත රසායනාගාරයක ස්ථාපිත කර ගැනීමට අවශ්‍ය සැලැස්ම සකස්කොට මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. ඒ තුළින් මෙවැනි ප්‍රමාද දෝෂයක් ඉවත්කර ගැනීමට හැකියාවක් පවතින බව සඳහන් කළ හැකිය.

(ඈ) අංක 61 (1) සහ 62 වගන්තිය

61 (1) වගන්තිය ප්‍රකාරව, එම භාණ්ඩවල සාම්පල ලැබීමෙන් පසු සති 6 ක කාලයක් සඳහා භාණ්ඩ විකිණීම හෝ අනාවරණය කිරීම සම්බන්ධ පැමිණිලිවලට අදාළ නියෝග නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව සවිස්තරාත්මකව දැනුම් දී ඇත. එහි ප්‍රති As ලයක් වශයෙන්, අනාගතයේදී ඕනෑම වේලාවක එවැනි නියෝග නිකුත් නොකිරීමට අවස්ථාවක් නොමැති බව මම ඔබට දන්වමි. තවද, මා විසින් ජ්‍යෙෂ් senior නිලධාරීන්ට දන්වා ඇත්තේ එවැනි සාම්පල සම්බන්ධයෙන් මාසිකව නිවැරදි පියවර ගෙන තිබේද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඒ අනුව අවශ්‍ය පියවර ගන්නා ලෙසයි.

(ඉ) 13 වගන්තිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලැබෙන පැමිණිලි පිළිබඳ ඔබ ඉල්ලුම් කර ඇති ආකෘතියට අනුව සවිස්තරාත්මකව තොරතුරු හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරිමට අදාළ සියළු කරුණු මේ වසරේ සම්පූර්ණ කරමින් පවතින අතර මේ සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේදයක් අනුව දත්ත පද්ධතියක් සැකසීමටද කටයුතු කරමින් පවතී.

- <u>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.</u>

අධිකාරියේ එවකට පැවති කළමනාකරණය විසින්, මානව සම්පත් විගණනයක් සිදුකිරීමට තීරණය කිරීමෙන් පසු අදාල අත්තිකාරම් මුදල වූ රු. 219,000/- ගෙවා ඇත. ඉන්පසුව නැවතත් එම මානව සම්පත් විගණනය අත්හිටුවීමට එම කළමනාකාරිත්වය තීරණය කොට ඇත. ඒ අනුව අවසානයේ ගෙවා ඇති මුදලට අනුකූල වන පරිදි අතුරු වාර්තාවක් ලබාගැනීමට තීරණය කරන ලදී.

**3. අනෙකුත් විගණන නිරීක්ෂණ**

(අ) පාරිභෝගිකයින්ට ක්ෂණිකව පැමිණිලි ඉදිරිපත්කිරීම සඳහා 1977 දුරකථන සේවාව කාර්යාල වේලාව තුළදී නිරන්තරයෙන්ම ආයතනයේ සේවක සේවිකාවන්ගේ සහයෝගය ඇතිව සිදුවන අතරම කාර්යාල වේලාවෙන් පසුව එන සෑම දුරකථන පැමිණිල්ලක්ම ස්වයංක්‍රියව පටිගතවන අතර ඒවා පසුදින උදෑසනම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අදාල අංශයේ නිලධාරීන් විසින් නිරීක්ෂණයට ලක්කොට ඒවාට අවශ්‍ය පිළිතුරු ලබාදීම වර්තමානයේ නිසි පරිදි ක්‍රියාත්මක වේ.

(ආ) 2003/9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත අදාළ සංශෝධන කටයුතු සියල්ලම නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නිසියාකාරව අධ්‍යයනයට ලක්කොට අවසන් කර එය වර්තමානයේ නීතිපති දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති බව දැක්වීමට කැමැත්තෙමි.

(ඇ),(ඈ) මෙම අඩුවෙන් සඳහන් යැයි ඉලක්කගත වැටලීම්වලට ප්‍රධාන හේතුව වී ඇත්තේ වැටලීම් ඉලක්ක සඳහන් කිරීමේදී අදාළ දිස්ත්‍රික්කයට එම වැටලීම් සම්බන්ධ කිරීම සහ එම ඉලක්කගත වැටලීම් වඩාත් සාර්ථක මෙන්ම වටිනාකමක් එකතු කළහැකි, සමාජ සුභසිද්ධිය වර්ධනය කළහැකි වැටලීම් විය යුතු බැවින් එවැනි වැටලීම් සඳහා වැඩි කාලයක් වැයවන බැවින් අධිකාරිය මෙහිදි බලාපොරොත්තු වන්නේ සංඛ්‍යානමය ඉලක්කයන් නොව ගුණාත්මකභාවයෙන් උසස් ඉලක්කයන් පවතීද යන්නය. ඒ අනුව කාලය ඉතා අවශ්‍යවන බැවින් සංඛ්‍යානමය වශයෙන් වැටලීම් ඉලක්කයන්වල සාපේක්ෂ අඩුවීමත් සිදුවිය හැකිය. එමෙන්ම, අතිරික්ත නිලධාරීන් ඇති දිස්ත්‍රික්ක හඳුනාගෙන, එම අතිරික්ත නිලධාරීන් වඩාත් ඵලදායි ලෙස දිස්ත්‍රික් හා වෙනත් අංශ වෙත මාරුකිරීමටත් තීරණයකර ඇති අතර දැනටමත් එම කටයුතු ආරම්භ කොට ඇත.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ආනයනකරුවන්ගේ හා බෙදාහරින්නන්ගේ උපරිම මිල සහතික කිරිම සඳහා ආයතන 53කින් අයදුම්පත් 280ක් ලැබී තිබූ අතර එම සෑම අයදුම්පතකටම අදාළ ගබඩා අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කොට ඒ අවශ්‍ය උපරිම මිල සහතිකය ලබාදීමට කටයුතු කර ඇත.

(ඊ) මෙම අධ්‍යක්ෂ ජනරාල්වරයා මේවනවිට ඉවත්කොට ඇත. අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා 2020.02.14 දින පත්කරන ලදී.

(උ) සුදුසුකම් තහවුරු කරගැනීමට නොහැකිව තිබූ නිලධාරීන් 38දෙනෙකුගේ සුදුසුකම තහවුරු කරගැනීමට මේවනවිට කටයුතු කර ඇති අතර, ඉතිරි තිදෙනාගේ තහවුරු කිරීම කඩිනමින් ල බාගැනීමට හෝ අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදුනි.

(ඌ) නව විමර්ශන නිලධාරින් 200 දෙනෙකු බඳවාගෙන ඔවුන් පුහුණුව සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත අනුයුක්ත කොට තිබුණි. කෙසේ නමුත්, විගණනය සඳහන්කර ඇති පරිදි අතිරික්තයක් හා ඌනතාවයක් දක්නට ලැබෙන අතර, එම තත්ත්වයන් මේවනවිටත් නිවැරදි කරමින් සිටිමි. තවදුරටත් මෙම තත්ත්වය සොයා බලා වහාම නිවැරදි කරනබව සඳහන් කරමි.

මේජර් ජනරාල් බී.එම්.එස්. දිසානායක (විශ්‍රාමික)

**සභාපති**